**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන , අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය**

## 1 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මතය

-----------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන , අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 1.2.1 නීතිරීති වලට අනුකූල නොවීම

-------------------------------

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 25 සහ 2004 ජූලි 29 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය විසින් තම අරමුදල් ආයෝජනය කිරීමේදී මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වුවත් , 2009 හා 2010 වර්ෂ වලදී පිළිවෙලින් ආයතනය විසින් තැන්පත් කළ රු. 1,460,360 ක හා රු. 227,771 ක ස්ථාවර තැන්පතු වෙනුවෙන් චක්‍රලේඛයට අනුව අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

#### 1.2.2 අධිකාර් බලය නොලත් ගනුදෙනු .

--------------------------------

1994 ජූනි 14 දින හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛයක් ප්‍රකාරව දෙවන හා තෙවන භාෂා ප්‍රවීනත්වය වෙනුවෙන් වැටුප් හා දිරිදීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේ දී රු. 13,570 ක් ගෙවා තිබුණි. 2003 ජූලි 18 දිනැති ජාතික අයවැය දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක බීඩී/අයිඑන්එස් /සීඑල්යූඑස්-ඒ/078 චක්‍රලේඛයට පටහැණිව විශ්වවිද්‍යාල අධ්‍යයන දීමනාව සාවද්‍ය ලෙස වැටුපට එකතු කර ගණනය කිරීම නිසා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට රු. 81,255ක් වූ වැඩිපුර ගෙවීමක් කර තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

--------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩකටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.28,568,771 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂ ඌනතාවය රු. 25,429,090 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා ලැබුණ රු. 26,200,000 ක්වූ රජයේ ප්‍රදානය හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ඌනතාවය රු. 2,368,772 ක් දක්වා අඩු වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණ රු.28,850,000 ක්වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ ඌනතාවය රු.3,420,909 ක අතිරික්තයකට පරිවර්තනය වී තිබුණි.

ඉකුත් වර්ෂයට අනුව සමාලෝචිත වර්ෂයේ රු. 5,789,682ක පිරිහීමක් සඳහා 1,738,316 ක ආදායම අඩුවීම හා 4,051,366 ක වියදම වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

-------------------------

#### 2.2.1 කාර්ය සාධනය

----------------

(අ) සමාලෝචිත වර්ෂය තුල විද්‍යාපති උපාධි පාඨමාලා 02 වෙනුවෙන් ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 19ක් වූ අතර එම උපාධිය සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව 10 ක් විය. වාර්ෂික ඒක ශිෂ්‍ය සාමාන්‍ය පිරිවැය රු.381,447ක් විය. මෙය පෙර වර්ෂය හා සසඳන විට රු.19,215 ක වැඩිවීමක් විය.

(ආ) දර්ශන විශාරද පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 6 ක් විය. සමාලෝචිත වර්ෂයේදී එක් ශිෂ්‍යයෙකු පමණක් උපාධිය සම්පූර්ණ කර තිබුණි. පාඨමාලා කාලසීමාව පූර්ණ/අර්ධ කාලීනව වර්ෂ 03 - 05 අතර විය.

(ඇ) දර්ශනශූර පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 12 ක් වූ අතර එක් ශිෂ්‍යයකු පමණක් උපාධිය සම්පූර්ණ කර තිබුණි. පාඨමාලා කාලසීමාව පූර්ණ/අර්ධ කාලීනව වර්ෂ 03 - 05 අතර විය.

(ඇ) 2010 වර්ෂය අවසන් වන විට පශ්චාත් උපාධි පාඨමාලා හදාරා සම්පූර්ණ කර ඇති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 41ක් වූ අතර එය දර්ශනපති, දර්ශන විශාරද 07 ක්ද ජෛව විද්‍යා විද්‍යාපති පාඨමාලාව 20 ක්ද සෛල හා අණුක ප්‍රතිශක්තිවේදී විද්‍යාපති පාඨමාලාව 14 ක්ද වශයෙන් විය.

(ඉ) ක්ෂේත්‍ර 08 ක් ආවරණය වන පරිදි පර්යේෂණ ව්‍යාපෘති 29 ක් පවත්වා තිබුණි. ඉන් පර්යේෂණ 10 ක කටයුතු සම්පූර්ණ කර වාර්තා නිකුත් කර තිබුණි. පර්යේෂණ ව්‍යාපෘති 19 ක කටයුතු කෙරගෙන යමින් පැවතුණි.

(ඊ) පශ්චාත් උපාධි පාඨමාලා සඳහා බාහිර කථිකාචාර්යවරු 22 දෙනෙකුගේ සේවය ලබා ගෙන තිබුණු අතර ඔවුන් විසින් දේශන පැය 175 ක් පවත්වා තිබුණි. මෙම බාහිර දේශකයින් සඳහා දරන ලද පිරිවැය රු. 213,550 ක් වූ අතර දේශන පැයක පිරිවැය රු. 1,220 ක් විය.

(උ) සමාලෝචිත වර්ෂය තුලදී පශ්චාත් උපාධි පාඨමාලා සම්බන්ධ විභාග 12 ක් පවත්වා ඇති අතර එම විභාග වෙනුවෙන් සිසුන් 78 දෙනෙකු පෙනී සිට ඇත. විභාග සියල්ලේම ප්‍රතිඵල 2010 වර්ෂය තුලදී නිකුත් කර තිබුණි.